# පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාවේ අවශ්‍යතා
පූර්ණය සඳහා ඉදිරිපත් කෙරෙන
නිබන්ධනයකි.

UCLIB
516663

රාජපක්‍ෂ දිසානායකගේ නාලනී දිසානායක
97/M.Phil/03

දිනය: 2002-02-19

University of Colombo Library

# සාරාංශය

ශ්‍රී ලංකාවේ දනට පවත්නා පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා සම්බන්ධව විචාරාත්මක අධ්‍යයනයක් කිරීම අධ්‍යයතන පර්යේෂණයෙන් සිදු කෙරේ. ලෝකයේ බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද විධිමත් අධ්‍යාපන පද්ධතියට ප්‍රවේශ වීමට පෙර සිටම දරුවන් අධ්‍යාපන කාර්යයන්හි නිරතවීමක් දක්නට ලැබේ. වර්තමාන ලෝකයේ සෑම රටකම පාහේ පෙරපාසල් අධ්‍යාපනය පූර්ණ අධ්‍යාපන ව්‍යුහයේ අවශ්‍යම අංගයක් ලෙස සැලකේ. තව ද අධ්‍යාපනයේ පවත්නා දැඩි තරඟකාරී ස්වභාවය, මව්වරුන් රැකියාවල නියුක්ත වීම, අධ්‍යාපනඥයින් විසින් කරන ලද පර්යේෂණ අනාවරණයන් ගෙන් පෙරපාසල් අධ්‍යාපනයේ වැදගත්කම ඉස්මතුවීම වැනි සාධක මත පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනයේ සීඝ්‍ර වර්ධනයක් සිදු වී ඇත. බොහෝවිට සංවර්ධනය වෙමින් පවත්නා රටවල පෙරපාසල් අධ්‍යාපනික වැඩ සටහන් ප්‍රමාණවත් වෘත්තීය පුහුණුවක් නොමැති අය විසින් පවත්වා ගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාවේ ද මෙවැනි තත්ත්වයන් පවතින බව බොහෝ අයගේ අදහසයි. මේ නිසා දනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවන්හි වත්මන් ස්වභාවය පිළිබඳව අධ්‍යයනය කිරීම කාලීන මෙන්ම වැදගත් අවශ්‍යතාවයක් වේ. අධ්‍යයතන පර්යේෂණයේ අරමුණ වූයේ,

- පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල ස්වභාවය සහ ගුරු පුහුණු වැඩ පිළිවෙල සංවිධානය වී ඇති ආකාරය විමසා බැලීම.
- පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවන්හි විෂයමාලාවේ ස්වභාවය විමසා බැලීම.
- පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවන් පිළිබඳව රාජ්‍ය අනුග්‍රහය සහ අධීක්ෂණයේ ස්වභාවය විමසා බැලීම.
- පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවන් පිළිබඳව පුහුණු වන සිසුන්ගේ ආකල්ප විමසා බැලීම.

යන ඒවා ය.

පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවන් වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ බස්නාහිර පළාතේ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක තුළ වන අතර එයිනුත් වැඩිම පාඨමාලා සංඛ්‍යාවක් ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කය තුළ ය. අන් පළාත්වල පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා පවත්වන ආයතන ඉතාමත් අඩු සංඛ්‍යාවක් විය. ඒ අනුව ඉහත කරුණු සහ ගුරු පුහුණු පාඨමාලා පවත්වන ආයතන පිහිටි ප්‍රදේශවල ගම්බද, නාගරික බව නියෝජනය වීම සඳහාත් අධ්‍යයතන අධ්‍යයනය සඳහා බස්නාහිර පළාතෙන් කොළඹ දිස්ත්‍රික්කයෙත්, වයඹ පළාතෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයෙත් පැවැත්වෙන පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා 9 ක් ඇසුරින් අධ්‍යයනය මෙහෙය වනු ලැබීය. තව ද විවිධ වර්ගවලට අයත් ආයතන මගින් පවත්වා ගෙන යන පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා නියෝජනය වීම සඳහා පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා පවත්වන ආයතනයේ ස්වභාවය අනුව රාජ්‍ය හා විශ්වවිද්‍යාල අධ්‍යාපනික ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන ලෙස ප්‍රධාන වශයෙන් කොටස් 3 කට බෙදා නියැදිය තෝරා ගන්නා ලදි. ඒ අනුව ස්ථරගත අහඹු නියැදි ක්‍රමය මත පර්යේෂණය සඳහා තෝරා ගත් නියැදියට පාඨමාලාවල ප්‍රධාන ආචාර්යවරුන් 9 ක්, පාඨමාලාවල ආචාර්යවරුන් 34 ක් සහ පාඨමාලා හදාරන සිසුන් 180 ක් ඇතුළත් විය.

පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල ප්‍රධාන ආචාර්යවරුන් සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් ද, පාඨමාලාවල ආචාර්යවරුන් සඳහා ප්‍රශ්නාවලි දීම මගින් ද, පාඨමාලා හදාරන සිසුන් සඳහා ආකල්ප පරීක්ෂණයක් දීම මගින් සහ ලිපි ලේඛන විමර්ශනය මගින් දත්ත රැස්කර ගන්නා ලදි. දත්ත රැස් කිරීමේ ක්‍රම භාවිත කරමින් පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල විවිධ ක්ෂෙත්‍රයන් ඔස්සේ රැස් කර ගත් දත්තයන් ප්‍රතිශතක, මධ්‍යන්‍යය වැනි විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම භාවිත කර විශ්ලේෂණය කර ගන්නා ලදි. ඒ අනුව දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය මගින් ලැබුණු නිගමනයන් ප්‍රධාන අරමුණු 4 යටතේ පහත සඳහන් පරිදි විය.

පෙරපාසල් ගුරුපුහුණු පාඨමාලාවල කාලසීමාව සම්බන්ධව නිශ්චිත බවක් නොමැතිවීම, පාඨමාලා වැඩි වශයෙන් අර්ධකාලීනව හා සති අන්තව පැවැත්වීම,

උපාධි මට්ටමේ හෝ පශ්චාත් උපාධි මට්ටමේ පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා නොමැතිවීම, රාජ්‍ය හා විශ්වවිද්‍යාල ආයතන මඟින් පවත්වා ගෙන යන පාඨමාලාවල වැඩි ආචාර්යවරුන් සංඛ්‍යාවක් සිටීම, 90 දශකය තුළ පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා පිහිටුවීම සම්බන්ධව රාජ්‍ය හා විශ්වවිද්‍යාල ආයතනවල දායකත්වය වැඩිවීම, පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවලට ඇතුළත්වීමේ දී සලකා බලන අවම වයස් සීමාව අවුරුදු 18 ක් වන අතර උපරිම වයස් සීමාව සම්බන්ධව විවිධත්වයක් තිබීම, පාඨමාලාවලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව පාඨමාලාවෙන් පාඨමාලාවට විවිධ වීම, බොහෝ පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා සඳහා ඇතුළත්වීමේ සුදුසුකම ලෙස අ.පො.ස.(සා.පෙ.) සමත්වීම සැළකුව ද, දැනට පෙරපාසල්වල සේවය කරන ගුරුවරියන් පුහුණුවීමේ දී ඉහත සුදුසුකම සමහර ආයතන මඟින් සලකා නොබැලීම යන ඒවා පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල ස්වභාවය සහ ඒවා සංවිධානය වී ඇති ආකාරය පිළිබඳව ලබා ගත් නිගමන වේ.

විවිධ පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල විෂයමාලාවන් අතර සුළු වශයෙන් විෂමතාවයන් ඇතත් සියලුම පාඨමාලා පෙරපාසල් ගුරුවරුන්ට අවශ්‍ය මූලික දැනුම, කුසලතා සහ ආකල්ප ලබාදීම ඉලක්ක කරගෙන සකසා තිබීම, පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල වාර අවසානයේ පවත්වන ලිඛිත පරීක්ෂණය, ප්‍රායෝගික පරීක්ෂණය හා ස්වාධීන නිබන්ධනය ඇසුරින් ඇගයීම් කටයුතු සිදු කිරීම යන ඒවා පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල විෂයමාලාවන්හි ස්වභාවය පිළිබඳව ලබාගත් නිගමන වේ.

රාජ්‍ය හා විශ්වවිද්‍යාල ආයතන මඟින් පවත්වා ගෙන යන පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල ආචාර්යවරුන් ලෙස ඉහළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ඇති රජයේ පාසල්වල ආචාර්යවරුන් බඳවා ගැනීම, පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාවල විෂය නිර්දේශයන් ලිඛිතව සකස් කර ඇතත් ඒ ඒ විෂයයන් සඳහා ගුරු අත්පොත් සකස් කර නොතිබීම, පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා සඳහා රාජ්‍ය අධීක්ෂණය සීමිත මට්ටමකින් තිබීම යන ඒවා පෙරපාසල් ගුරු පුහුණු

පාඨාමාලවන් සඳහා රාජ්‍ය අනුග්‍රහය සහ අධීක්ෂණයේ ස්වභාවය පිළිබඳව ලබාගත් නිගමන වේ.

පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා පිළිබඳව පුහුණු වන සිසුන්ගේ ආකල්ප ප්‍රධාන තේමාවන් 11 ක් යටතේ විමසා බලන ලදි. ඒ අනුව සියලුම තේමාවන් සම්බන්ධව රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන මගින් පවත්වා ගෙන යන පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා හදාරන සිසුන්ගේ ආකල්ප මට්ටම රාජ්‍ය හා විශ්වවිද්‍යාල ආයතන මගින් පවත්වා ගෙන යන පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා හදාරන සිසුන්ගේ ආකල්ප මට්ටමට වඩා පහළ අගයක් ගැනීම, පාඨමාලා ගාස්තුව වාරික වශයෙන් ගෙවීම පහසුවකි සහ සති අන්තයේ දිනවල පාඨාමලාවන් පැවැත්වීම පිළිබඳව ධනාත්මක ආකල්ප පුහුණු වන සිසුන් දක්වන අතර ඉතිරි තේමාවන් සම්බන්ධව මධ්‍යස්ථ ආකල්ප දැක්වීම යන ඒවා පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලා පිළිබඳව පුහුණු වන සිසුන්ගේ ආකල්ප මත ලබා ගත් නිගමන වේ.